INTRODUCTION TO ECONOMICS (Part-VIII)

S. Madushanka

B.Sc (Mgt) Accounting (Special) (U.G)

University of of Sri Jayewardenepura

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය

යම් දෙන ලද අවස්ථාවක දී ආර්ථිකයක් සතු සියලුම සම්පත් පවත්නා තාක්ෂණය යටතේ උපරිම කාර්යක්ෂමතාවෙන් උපයෝජනය කොට, කිසියම් භාණ්ඩ දෙකකින් නිපදවිය හැකි උපරිම භාණ්ඩ සංයෝග සම්බන්ධ කොට අඳින ලද රේඛාව නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ලෙස හැඳින්වේ.

නිෂ්පාදන ධාරිතා ඉම, නිෂ්පාදන ශක්‍යතා පර්යන්තය, විභව නිෂ්පාදන හැකියා සීමාව යන නම්වලින් ද නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය හඳුන්වනු ලබයි.

ClassWork.LK

ආර්ථිකයක නිෂ්පාදන හැකියාව තීරණය කරන සාධක

සම්පත් සම්භාරය

- ✓ භූමිය
- ✓ ශ්‍රමය
- ✓ ප්‍රාග්ධනය
- ✓ ව්‍යවසායකත්වය

සාධක ඵලදායිතාව

- ✓ තාක්ෂණය
- ✓ මානව ප්‍රාග්ධනය
- ✓ කළමනාකරණය

ClassWork.LK

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය නිර්මාණය කිරීමේ දී යොදා ගන්නා උපකල්පන

- භාණ්ඩ වර්ග දෙකක් පමණක් නිපදවීම
- ආර්ථිකය සතු සම්පත් සම්භාරය ස්ථාවර වීම
- අදාළ කාලය තුළ තාක්ෂණය නොවෙනස් ව පැවතීම
- සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයෙන් යුක්ත ව උපයෝජනය කිරීම

අනුක්‍රමණය හෙවත් බැවුම

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක් මත ගමන් කරන විට එක් භාණ්ඩයක නිෂ්පාදනය නිශ්චිත ප්‍රමාණය බැගින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැප කිරීමට සිදු වන ප්‍රමාණය අතර අනුපාතය, අනුක්‍රමණය හෙවත් බැවුම ලෙස හැඳින්වේ.

එම බැවුම මගින් ආන්තික ආවස්ථික පිරිවැය දැක්වේ.

ClassWork.LK

නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ආන්තික ආවස්ථික පිරිවැය හැසිරෙන ආකාරය අනුව පවත්නා ස්වරූප

- ස්ථාවර ආවස්ථික පිරිවැය
- වැඩෙන ආවස්ථික පිරිවැය

ස්ථාවර ආවස්ථික පිරිවැය

නිෂ්පාදන හැකියා මායිමක් මත ගමන් කිරීමේ දී එක් භාණ්ඩ වර්ගයකින් නිශ්චිත ප්‍රමාණය බැගින් වැඩි කිරීමේ දී අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය නොවෙනස් ව පවතින තත්ත්වයක් ස්ථාවර ආවස්ථික පිරිවැය වශයෙන් හඳුන්වයි.

මෙවැනි ස්ථාවර ආවස්ථික පිරිවැයකින් යුතු නිෂ්පාදන හැකියා මායිම **සරල රේඛීය ස්වභාවයක්** ගනී. මෙය පහත රූප සටහනින් පෙන්නුම් කෙරේ.

ClassWork.LK



<u>නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයක ආවස්ථික පිරිවැය ගණනය කළ හැකි සූත්‍රය</u>

$$\text{ආවස්ථික පිරිවැය} = \frac{\text{කැප කරන ලද භාණ්ඩ ප්‍රමාණය}}{\text{වැඩි කරන ලද භාණ්ඩ ප්‍රමාණය}}$$

ClassWork.LK

ඉහත සරල රේඛීය නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ආවස්ථික පිරිවැය පහත ආකාරයට ගණනය කළ හැකිය

භාණ්ඩ සංයෝගය	x නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය $\frac{-\Delta y}{+\Delta x}$	y නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය $\frac{-\Delta x}{+\Delta y}$
A – B	$\frac{-4}{1} = -4$	$\frac{-1}{4} = \frac{-1}{4}$
B- C	$\frac{-4}{1} = -4$	$\frac{-1}{4} = \frac{-1}{4}$
C – D	$\frac{-4}{1} = -4$	$\frac{-1}{4} = \frac{-1}{4}$
D – E	$\frac{-4}{1} = -4$	$\frac{-1}{4} = \frac{-1}{4}$
E - F	$\frac{-4}{1} = -4$	$\frac{-1}{4} = \frac{-1}{4}$

වැඩෙන ආවස්ථික පිරිවැය

නිෂ්පාදන හැකියා මායිම මත ගමන් කිරීමේ දී කිසියම් භාණ්ඩ වර්ගයක නිශ්චිත ප්‍රමාණය බැගින් වැඩි කරන විට අනෙක් භාණ්ඩයෙන් කැප කරන ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි වන තත්ත්වයක් වැඩෙන ආවස්ථික පිරිවැය වශයෙන් හඳුන්වයි.

මෙවැනි වැඩෙන ආවස්ථික පිරිවැයකින් යුතු නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය **මූලයට අවතල හැඩයක්** ගනියි. මෙය පහත රූප සටහනින් පෙන්නුම් කෙරේ.

ClassWork



නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත පහළට ගමන් කරන විට $\frac{Ay}{Ax}$ අනුපාතය ක්‍රමයෙන් වැඩි වේ.

ඉහත මූලයට අවතල නිෂ්පාදන හැකියා මායිම් වක්‍රයේ ආවස්ථික පිරිවැය පහත ආකාරයට ගණනය කළ හැකිය

භාණ්ඩ සංයෝගය	x නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය $\frac{-\Delta y}{+\Delta x}$	y නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය $\frac{-\Delta x}{+\Delta y}$
A – B	$\frac{-20}{20} = -1.0$	$\frac{-20}{20} = -1.0$
B- C	$\frac{-30}{20} = -1.5$	$\frac{-20}{30} = -0.6$
C – D	$\frac{-40}{20} = -2.0$	$\frac{-20}{40} = -0.5$
D – E	$\frac{-50}{20} = -2.5$	$\frac{-20}{50} = -0.4$
E - F	$\frac{-60}{20} = -3.0$	$\frac{-20}{60} = -0.3$

ESS WORK.LK

ස්ථාවර ආවස්ථික පිරිවැය හා වැඩෙන ආවස්ථික පිරිවැය ඇති වීම කෙරෙහි බලපාන හේතූ

ස්ථාවර ආවස්ථික පිරිවැය ඇති වීමට හේතු	වැඩෙන ආවස්ථික පිරිවැය ඇති වීමට හේතු
සම්පත් සමජාතීය වීම එක් නිෂ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම වීම	සම්පත් සමජාතීය නොවීම එක් නිෂ්පාදනයක් සඳහා කාර්යක්ෂම වන සම්පත් අනෙක් නිෂ්පාදනය සඳහා කාර්යක්ෂම නොවීම

ඉහත සඳහන් ආවස්ථික පිරිවැය තත්ත්වයන් අතරින් වඩාත් තාත්ත්වික බව, පෙන්නුම් කරනුයේ වැඩෙන ආවස්ථික පිරිවැය යි.

මේ නිසා විවිධ ආර්ථික විග්‍රහයන් පැහැදිලි කිරීම සඳහා වැඩෙන ආවස්ථික පිරිවැය යොදා ගනියි.

ClassWork.LK

2021
2022
2023

උසස් පෙළ

ගිණුම්කරණය
ආර්ථික විද්‍යාව
ව්‍යාපාර අධ්‍යයනය

2021
2022

සාමාන්‍ය පෙළ

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

තනි හෝ කණ්ඩායම් පන්ති

(English & Sinhala Medium)

0763655550

S. Madushanka
B.Sc (Mgt) Accounting (Special) (U.G)
University of of Sri Jayewardenepura